# කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආහාර නිෂ්පාදන හා ජල අවශ්‍යතාව

*ඩබ්. එම්. ජී. බී. ගිරාගම*
*පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී*

ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය සඳහා වැඩි දායකත්වයක් දෙන ප්‍රධාන දිස්ත්‍රික්කයකි, කුරුණෑගල. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අනුව 1990/91 මහ කන්නයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය ලංකාවේ මුළු නිෂ්පාදනයෙන් 16%ක් බව පහත දැක්වෙන වගුවෙන් පැහැදිළි වේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 68,961ක් පමණ වී වගාව කෙරෙන අතර, එයින් විශාල වාරිමාර්ග ක්‍රම යටතේ හෙක්ටයාර් 11,539 (16.73%)ක් පමණ වගා කෙරේ. ඉතිරි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 28,520(41.36%) සුළු වාරිමාර්ග සහ තවත් හෙක්ටයාර් 28902 (41.91%) පමණ වර්ෂා ජලයෙන් වගා කෙරේ. මෙහිදී දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වී තිබෙන්නේ වර්ෂාපෝෂිත කුඹුරුවල අස්වැන්න අනෙක් ඒවාට වඩා සැළකිය යුතු අන්දමින් අඩුවීමක් පෙන්නුම් කර තිබීමයි. මීට හේතු වශයෙන් දැකිය හැක්කේ අවශ්‍ය කාලයේදී (කලට වේලාවට) ප්‍රමාණවත් වැසි නොලැබීමයි.

වර්ෂාපෝෂිත බිම්වල ප්‍රමාණය දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස, ගත් විට මෙසේ දිස් වේ.

| | |
|---|---|
| මාතලේ | 21.11% |
| අනුරාධපුරය | 1.74% |
| පොළොන්නරුව | 3.36% |
| හම්බන්තොට | 5.65% |

කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ 1982-1991 කාලයේදී වගා කරන ලද බිම් ප්‍රමාණයේ සාමාන්‍ය අගය ගත් විට මහ කන්නයේදී හෙක්ටයාර් 65,668ක් හා යල කන්නයේ දී හෙක්ටයාර් 42,130ක් ද වී වගාව සඳහා යොදගෙන ඇත. යල කන්නයේදී මහ

## විශේෂාංගය

කන්නයට වඩා හෙක්ටයාර් 23,538ක් පමණ වගා කරන ලද බිම් ප්‍රමාණයේ අඩුවීමක් පෙන්නුම් කර ඇත. මෙයට ප්‍රධාන හේතුව අවශ්‍ය තරම් ජලය නොලැබීම ප්‍රමාණය වගාවට යොදා ගැනීමෙන් ඉහත සඳහන් නිෂ්පාදන ප්‍රමාණය යල කන්නයේදීත් මුළු නිෂ්පාදනයට එකතු කරගත හැකිය. මෙම ප්‍රදේශයේ අත්හැර දමා තිබෙන වැව් පුනරුත්ථාපනය කර භාවිතයට ගැනීම මෙයට විසඳුමක් වශයෙන් පෙනී යයි. මීට අමතරව කෘෂිකාර්මික ළිං ප්‍රයෝජනයට ගැනීමෙන් මෙම ප්‍රශ්නයට සහනයක් ලබාදිය හැකිය.

අනෙකුත් දිස්ත්‍රික්කවලට මෙන් වසර මුළුල්ලේ ලැබෙන වැසිදියෙන් පෝෂණය වන ගංගා ආශ්‍රිත වාරිමාර්ග පහසුකම් නැති, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වගාවන් සඳහා ජලය ලැබෙනුයේ එම දිස්ත්‍රික්කයට ලැබෙන වර්ෂාපතනයෙන් පමණි. (මහවැලි වැනි විශාල ව්‍යාපෘතිවල ජලය කුරුණෑගලට නොලැබේ) එම දිස්ත්‍රික්කයේ යල හා මහ යන කන්න දෙක 1982 සිට 1991 දක්වා කාලය තුළ වර්ෂාපතනය (බතලගොඩ කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයේ දත්ත) හා වී වගාකළ බිම් ප්‍රමාණය මු. ඇට, කව්පි හා මිරිස් යන වගාවන්ගේ අස්වැන්න පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

**1990/91 මහ කන්නයේ වී පිළිබඳ සංඛ්‍යාලේඛන**

| දිස්ත්‍රික්කය | දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | | | ශුද්ධ හෙක්ටයාරයට සමාන නම් අස්වැන්න කි. ග්‍රෑම් | | | | සම්පූර්ණ නිෂ්පාදන මෙට්‍රික් ටොන් දහස් |
|---|---|---|---|---|---|---|---|---|
| | විශාල වාරිමාර්ග | සුළු වාරිමා: | වර්ෂා පෝෂිත | විශාල වාරිමා: | සුළු වාරි: | වර්ෂා පෝෂිත | සාමාන්‍ය | |
| කෑගල්ල | - | 2,552 | 8,507 | - | 3,507 | 3,437 | 3,453 | 36 |
| කුරුණෑගල | 11,539 | 28,520 | 28,902 | 4,201 | 3,742 | 3,264 | 3,619 | 249 |
| මාතලේ | 4,398 | 6,975 | 3,017 | 4,342 | 4,698 | 4,306 | 4,506 | 58 |
| අනුරාධපුරය | 16,487 | 14,037 | 541 | 4,313 | 3,882 | 2,723 | 4,096 | 98 |
| පොළොන්නරුව | 41,669 | 526 | 1,465 | 4,492 | 3,489 | 3,083 | 4,438 | 170 |
| හම්බන්තොට | 14,103 | 2,535 | 996 | 4,640 | 3,898 | 3,112 | 4,455 | 67 |
| ශ්‍රී ලංකාව | | | | | | | 3,620 | 1,554 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

වාරිමාර්ග පහසුකම් සළසා තිබෙන ප්‍රදේශවලට මෙම ගැටළුව මෙලෙසින් බලපා නැත. අනෙකුත් වී වගා කෙරෙන දිස්ත්‍රික්ක හා සසඳන විට කුරුණෑගල දිස්ත්‍රික්කයේ 'සාමාන්‍ය අස්වැන්න' තරමක අඩු අගයක් ගෙන තිබේ. මීට හේතුව වශයෙන් පෙනෙනුයේ අනෙකුත් දිස්ත්‍රික්කවල වාරි පහසුකම් ඇති බිම් ප්‍රමාණයට සාපේක්ෂව විශාල වීමයි. බව පෙනී යයි. එම භූමි ප්‍රමාණය යල කන්නයේදී වගාකිරීමට හැකි වුනි නම්, අවම වශයෙන් වසරකට තවත්, වී මෙට්‍රික් ටොන් 66,134ක් නිෂ්පාදනය කිරීමට හැකිවනු ඇත. මෙය එම දිස්ත්‍රික්කයේ මුළු නිෂ්පාදනය සළකන විට 27% පමණ වේ. මෙම වගා බිම්වලට ජලය සපයා ගැනීමට ක්‍රමයක් තිබේ නම් මේ අපතේ හරින ලද බිම්

ඉහත වගුවට අනුව 1984 යල හා මහ කන්නවලදී ඉතා ආසන්න ලෙස එක හා සමාන භූමි ප්‍රමාණයක් වී වගාකර ඇති අතර, අස්වැන්න ද ඊට අනුකූල වී ඇත. මෙයට හේතුව විය හැක්කේ මාර්තු හා අප්‍රේල් මාසවල ලැබුණු මි. මී. 327 හා 309 පමණ වූ වැඩි වර්ෂාපතනයක් ඒවා එම යල කන්නය සඳහා උපයෝගී කරගැනීමත්

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආහාර නිෂ්පාදන දත්ත**

| වර්ෂය | | 1982 | 1984 | 1986 | 1988 | 1990 | 1991 |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂාපතනය (මි.මී.) | මහ | 916 | 1,678 | 1,340 | 1,473 | 1,244 | 1,260 |
| | යල | 823 | 594 | 487 | 1,215 | 533 | 676 |
| වී වගාකළ බිම් | මහ | 63,525 | 63,375 | 71,604 | 69,662 | 67,743 | 68,961 |
| ප්‍රමාණය (හෙක්:) | යල | 44,426 | 61,234 | 48,156 | 53,119 | 40,257 | 42,267 |
| වී අස්වැන්න | මහ | 3,697 | 3,055 | 3,723 | 3,352 | 3,435 | 3,618 |
| කි. ග්‍රෑ/හෙක්: | යල | 3,452 | 2,984 | 2,810 | 3,008 | 2,666 | 2,814 |
| මුං ඇට අස්වැන්න | මහ | 575 | 639 | 595 | 506 | 629 | 628 |
| කි. ග්‍රෑ/හෙක්: | යල | 509 | 699 | 661 | 582 | 618 | 643 |
| කව්පි අස්වැන්න | මහ | 703 | 783 | 762 | 658 | 806 | 794 |
| කි. ග්‍රෑ/හෙක්: | යල | 469 | 763 | 750 | 736 | 731 | 778 |
| මිරිස් අස්වැන්න | මහ | 803 | 2,455 | 2,649 | 2,917 | 2,547 | 3,139 |
| කි. ග්‍රෑ/හෙක්: | යල | 809 | 2,512 | 2,386 | 3,590 | 2,760 | 3,513 |

මූලය : සංඛ්‍යාලේඛන හා ජනලේඛණ දෙපාර්තමේන්තුව.

වේ. උපරිම වී අස්වැන්නක් පෙන්නුම් කර ඇති 1986 මහ කන්නයේදී ඒ ඒ මාසවලදී ලැබුණු වර්ෂාපතනයේ ඉහළ අගයක් පෙන්නුම් කර ඇති අතර එහි ව්‍යාප්ත වූ ස්වභාවයක් ද පෙන්නුම් කරයි. 1981/82 මහ කන්නය සළකා බලන විට අනෙක් අවුරුදු වලට සාපේක්ෂව වැඩි අස්වැන්න ප්‍රමාණයක් ලැබී තිබේ. එම කන්නය ආරම්භයේ දී ලැබුණු වැඩි වර්ෂාපතනයක් අස්වනු නෙළන කාලයේදී වඩා උචිත වන පරිදි, ලැබුණු වර්ෂාපතනයේ අඩුවීමත්, මෙයට හේතු වී ඇති බව පෙනේ.

මුං වගාවේ වැඩි අස්වැන්නක් පෙන්නුම් කරන 1984 හා 1986 යල කන්නයන් ගත්විට අනෙක් වගා කන්නවලට සාපේක්ෂව අඩු වර්ෂාපතනයක් ලබා ඇති අතර 1986 හා 88 මහ කන්නවල වැඩි වර්ෂාපතනයක් පෙන්නුම් කරමින් අඩු අස්වැන්නක් ලබාදී ඇත. මෙම කන්නවල මුල් මාසය හෝ දෙක තුළ වැඩි වර්ෂාපතන අගයක් පෙන්වන අතර ඉතිරි මාස වලදී ඉතා අඩු වර්ෂාපතන අගයක් පෙන්නුම් කරයි. ඒවා වගාව පවත්වාගැනීම සඳහා උචිත වන පරිදි පැතිරුණු ස්වභාවයකින් ලැබී තිබේ. 1986 හා 1988 මහ කන්නවල මුං ඇට වගාව සළකා බලන විට, වපුරන කාලයේදී වැඩිවර්ෂාපතනයක් පෙන්නුම් කරනවා මෙන්ම ඊට පසු මාසවලද වර්ෂාපතනයේ වැඩි අගයක් පෙන්නුම් කර තිබේ. එසේ වැඩි වැසි ලැබීම මේ කන්නයන් තුළ අස්වනු අඩුවීමට බලපා ඇති බව පෙනේ.

කව්පි වගාවේ වැඩි අස්වැන්නක් පෙන්වන 1990 හා 91 මහ කන්නවල වැඩි වර්ෂාපතනයක් මෙන්ම වැඩි අස්වැන්නක් ද ලැබී ඇති අතර අඩු අස්වැන්නක් ලැබී ඇති 1982 යල මහ කන්නවල වර්ෂාපතනය ද අඩු වී ඇත. මුං ඇට වලට මෙන් නොව කව්පි වගාවට ඊට වඩා වැඩි එසේම පැතිරුණු වර්ෂාපතනයක් තිබේ නම් වඩා හොඳ අස්වැන්නක් ලැබීමට හේතුවන බව ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන පැහැදිළි කරයි.

මිරිස් වගාවේ වැඩි අස්වැන්නක් ලැබී ඇති 1988 යල හා 1991 මහ කන්නවල වැඩි වර්ෂාපතනයක් පෙන්නුම් කළ ද 1991 යල කන්නයේදී අඩු වර්ෂාපතනයක් යටතේ වැඩි අස්වැන්නක් පෙන්නුම් කරනුයේ අස්වැන්න නෙළන අවධියේ වැසි අඩුවීම නිසා විය හැකිය.

වගාවේ එක් එක් කාලය තුළ වර්ෂාව, උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය වැනි සාධක අස්වැන්න කෙරෙහි බලපාන අයුරු සැළකිල්ලට ගෙන වගා කරන දින වකවානු තෝරාගත්තේ නම් හා ජල අවශ්‍යතාව සාපේක්ෂව අඩු මුං ඇට වැනි වගාවන්, වැසි දිය උපයෝගී කරගෙන වියළි ගොඩ බිම්වල වගා කරන්නේ නම් භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකිවනු ඇත.

ජල හිඟයට පිළියමක් වශයෙන් දැනට යොදගනිමින් පවතින කෘෂි ළිං භාවිතයෙන් බහුලව කෙරෙනුයේ අතිරේක බෝග වගාවයි. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ 1991 වර්ෂයේ දී මුළුමනින්ම මුං ඇට, කව්පි හා මිරිස් හෙක්ටයාර් 8009, 7486 හා 2044ක් වගාකර ඇති අතර පිළිවෙලින් මෙට්‍රික් ටොන් 5,073, 5,902 හා 6,913ක නිෂ්පාදනයක් ලබා ඇත. කෘෂි ළිං වලින් වගාවන්ට ජලය සැපයීම සඳහා දැනට භූමිතෙල් වැනි ඉන්ධන වලින් ක්‍රියා කරන වතුර පොම්ප යොදගනු ලැබේ. මෙසේ ඉන්ධන වියදමක් දැරීමට සිදුවීම වගාවේ වියදම් වැඩි කිරීමට හා ඒ තුළින් ආර්ථික ප්‍රතිලාභ හීනකරවීම සිදු කරවන්නකි. මීට විකල්පයක් වශයෙන් අනාගතයේදී, සාපේක්ෂව අඩු වියදමකින් සූර්ය බලශක්තිය උපයෝගී කරගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය එසේ වුවහොත් වියළි කලාපයේ ගොවීන් වැඩි පිරිසකට වගාවට අවශ්‍ය ජලය පහසුවෙන් ලබාගැනීමට හැකිවනු ඇත.

## පුවත්පත් වලින් ...

*(සකස් කරන ලද්දේ ගුණරත්න රාමනායක විසිනි)*

**පොල් නිපැයුම අඩුවේ**

1992 වසරේ පොල් නිෂ්පාදනය, වාර්ෂික සාමාන්‍ය නිෂ්පාදනයට වඩා අඩු වෙනු ඇතැයි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඇස්තමේන්තු වලින් හෙළිවේ.

ඒ අනුව 1992 වසරේ නිෂ්පාදනය පොල් දශලක්ෂ 2,380 වන අතර එය 1991 වසරෙහි නිෂ්පාදන වන දශලක්ෂ 2,184ට වඩා වැඩිවනු ඇත.

පොල් නිෂ්පාදනයෙහි සැළකිය යුතු වර්ධනයක් 1992 දී පෙන්නුම් කෙරුණද සාමාන්‍ය වාර්ෂික නිෂ්පාදනය වන දශලක්ෂ 2,500ට වඩා අඩු වේ.

අයහපත්‍රදායක කාලගුණ තත්ත්වයන් පොහොර යෙදීම අඩු වීමත් මෙයට හේතු ලෙස සැළකේ.

*(ද අයිලන්ඩ් - 93 ජනවාරි 4)*